**ශීර්ෂය 119 - විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමන් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් සිදුකර තිබුණු නිර්දේශ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන පරිදි ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය. | ඉදිරියේදී මු.රෙ.891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් සහ සේවකයන්ගේ තොරතුරු ඇතුලත් ඇප ලේඛණයක් පවත්වා ගැනීමට කටයුතු කරන බව. |

| | | |
|---|---|---|
| (ආ) ණය මුදල් සඳහා ඇප කරුවන් ඉදිරිපත් කරන අවස්ථාවේදී අදාල ඇප කරුවන් ඇප වීමට ඇති හැකියාව නිශ්චය කර ගැනීම සඳහා ඇප ලේඛණයක් පවත්වාගත යුතු වුවත් ඒ අනුව ලේඛණයක් පවත්වා නොතිබුණි. | ඇප ලේඛණයක් පවත්වාගත යුතුය. | 2018 වර්ෂයේ සිට ඇප ලේඛණයක් පවත්වාගෙන යනු ලබන බව. |

**1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------------

අමාත්‍යාංශයේ නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛය | මහජනයාට ලබාදෙන සේවාවන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ලබා දීමට අවශ්‍ය වන පසුබිම සැකසීමට අමාත්‍යාංශය සඳහා වූ පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කටයුතු සිදු කරමින් පවතින බව. |
| (ආ) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කෙටුම්පත සකස් කර ඇති බව. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **අග්‍රිම කළමනාකරනය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| අංක 119-1-2-6-2506 දරන වැය විෂය යටතේ ප්‍රතිපාදිත මුදල වූ රු.140,000,000 න් රු.84,183,986 ක් හෙවත් සියයට 60 ක් ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයන් සහ අග්‍රිම නොලැබීම මත ඉතිරිවී තිබුණු අතර අංක 119-2-7-1-1503 දරන වැය විෂය යටතේ ප්‍රතිපාදිත මුදල වූ රු.120,000,000 න් රු. 16,630,332 ක් එනම් සියයට 14 ක් අග්‍රිම නිදහස් නොකිරීම හේතුවෙන් ඉතිරි වී තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ප්‍රමාද නොකර ව්‍යාපෘති ආරම්භ කළ යුතුය . | වාර්තාවේ කරුණු සමඟ එකඟ වෙන බව. |

**2.2 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කෙරේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පුනරාවර්තන වැය විෂයයන්හි සලසා තිබූ ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 5 සිට සියයට 87 දක්වා පරාසයක් තුල විහිදි තිබූ අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර වැය විෂයයන් 22 කට අදාලව එලෙස ඉතිරි වී ඇති මුළු ප්‍රතිපාදනවල වටිනාකම රු. 220,104,490ක් විය. නව ගොඩනැගිල්ලක් සඳහා වූ රු.මිලියන 200 ක බදු ගිවිසුමට එකඟතාවය නොලැබීම මෙම ප්‍රතිපාදිත ඉතිරිවීම සඳහා මූලික වශයෙන් හේතු වී ඇති බව විගණනයට වාර්තා කර තිබුණි. | ප්‍රතිපාදන නිවැරදිව ඇස්තමේන්තු කිරීම සහ උපයෝජනය විධිමත්ව කිරීම. | අමාත්‍යාංශය නව ගොඩනැගිල්ලකට ගෙන යාම සඳහා අමාත්‍යාංශයේ අනුමැතිය මත රු. මිලියන 200 ක අමතර ප්‍රතිපාදනයක් භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද අතර නව ගොඩනැගිල්ලට අදාළ බදු ගිවිසුමට එකඟත්වය නොලැබීම නිසා බදු ගිවිසුමට එළඹීමට නොහැකි විය. එම නිසා මෙම රු. මිලියන 200 ක ප්‍රතිපාදන ඉතිරි වී ඇති අතර එය ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයෙන් හෝ ඇස්තමේන්තු කිරීමේ දුර්වලතාවයක් ලෙස වාර්තා කිරීම පිළිබඳව එකඟ විය නොහැකිය. |
| (ආ) මූලධන වියදම් වැය විෂයයන්හි සලසා තිබූ ප්‍රතිපාදන ඉතිරිවීම් සියයට 25 සිට සියයට 100 දක්වා පරාසයක් තුල විහිදි තිබූ අවස්ථාවන් නිරීක්ෂණය වූ අතර වැය විෂයයන් 05 කට අදාලව එලෙස ඉතිරි වී ඇති මුළු ප්‍රතිපාදනවල වටිනාකම රු.98,365,119 ක් විය. මේ සඳහා ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා හා ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයන් හේතු වී තිබූ බවද නිරීක්ෂණය විය. | -එම- | වාර්තාවේ කරුණු සමඟ එකඟ වෙන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආසියානු සංවර්ධන බැංකුව සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල විසින් දරන ලද සෘජු වියදම් ගිණුම් ගත නොවීම හේතුවෙන් වැය විෂයය අංක 119-2-7-11-2506 (13) සහ අංක 119-2-7-10-2506(13) යටතේ වූ ව්‍යාපෘති දෙකක රු. 14,371,755 ක් ඉතිරිවීම් ලෙස දක්වා තිබුණි. | විදේශ ව්‍යාපෘති සම්බන්ධයෙන් වූ සෘජු වියදම් ගිණුම් ගත කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම. | අදාළ ව්‍යාපෘති කාර්යාල හරහා අමාත්‍යාංශයට වාර්තා කර ඇති වියදම් නිවැරදිව ගිණුම්ගත කර ඇති බව. |

## 2.3 බැරකම් හා බැදීම් වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව යම් කිසි නිශ්චිත දිනකට එක් එක් වැය විෂයය සඳහා වූ බැදීම් හා බැරකම් ප්‍රමාණය හඳුනාගැනීම සඳහා සෑම වියදම් ඒකකයන් විසින්ම දිනපතා තම බැදීම් හා බැරකම් පිළිබඳ තොරතුරු www.newcigas.treasury.gov.lk වෙබ් අඩවියට උත්පනය කළ යුතු බව සඳහන් කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | තොරතුරු පද්ධතිය දිනපතා යාවත්කාලීන කළයුතු වීම. | වාර්තාවේ කරුණු සමඟ එකඟ වෙන බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන් විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මෙ.වො. 31 මොරගොල්ල ජල විදුලිබලාගාරය ඉදිකිරීම<br><br>මෙගා වොට් 31 ක ධාරිතාවයක් ජාතික විදුලි ජාලය වෙත ලබාගැනීම සඳහා ක්‍රියාත්මක මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීමට අදාල ව්‍යාපෘතිය 2014 වර්ෂයේ ආරම්භ කිරීමට සැලසුම් කළ ද අවුරුදු 3 ක ප්‍රමාද කාලයෙන් පසුව මෙහි වැඩකටයුතු 2017 වර්ෂයේ දී ආරම්භ කර ඇත. ඒ සඳහා රු.මිලියන 16,780 ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබී ඇති අතර මෙම ව්‍යාපෘතිය නියමිත දිනට ආරම්භ නොකිරීම හේතුවෙන් ලබාගත් ණය මුදල් වෙනුවෙන් රු.මිලියන 28 කට ආසන්න මුදලක් (USD 177,931) දණ්ඩන ලෙස (Commitment Charges) ගෙවීමට සිදුව තිබුණි. භෞතික ප්‍රගතිය 2019 දෙසැම්බර් 31 දිනට සියයට 26 කි. | නියමිත කාලවකවානු තුල ව්‍යාපෘති ඉටු කිරීමට හැකිවන පරිදි සැලසුම් විධිමත් පරිදි පිළියෙල කර කාල රාමුව ඇතුලත ඉටු කිරීමට කටයුතු කළ යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 24 ක් ලෙස නිවැරදි විය යුතු බව. |

| | | |
|---|---|---|
| (ආ) ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය<br>-----------------------------------------------<br>මෙම ව්‍යාපෘතිය 2015 ජනවාරි මස ආරම්භ කර 2018 ජනවාරි මස නිම කිරීමට නියමිතව තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 23,720 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 දින වන විට වියදම රු. මිලියන 3,488 ක් විය. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 2 ක් විය. | - එම - | වාර්තාවේ කරුණු සමඟ එකඟ වෙන බව. |
| (ඇ) මෙ.වො. 35 බ්‍රෝඩ්ලන්ඩ්ස් ජල විදුලි බලාගාර ව්‍යාපෘතිය<br>-----------------------------------------------<br>මෙම ව්‍යාපෘතිය 2013 අගෝස්තු මස ආරම්භ කර 2017 අගෝස්තු මස නිම කිරීමට නියමිතව තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 9,424 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 දින වන විට වියදම රු. මිලියන 6,426 ක් විය. ඒ අනුව භෞතික ප්‍රගතිය සියයට 74 කි. | - එම - | 2019 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රු.මිලියන 9,385 ක් විය යුතු බව. |

## 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව සහ ස්වකීය රාජකාරි කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව රජයේ නිලධාරීන් විසින් ඇප තැබිය යුතුය.<br>තවද මුදල් රෙගුලාසි 881 ප්‍රකාරව නිලධාරියෙකු එවැනි තනතුරකට පත් කළ දින සිට දෙමසක් ඇතුලත ඇප තැබිය යුතු වේ. | මුදල් රෙගුලාසි 888 හා 881 ප්‍රකාරව නිලධාරියෙකු එවැනි තනතුරකට පත් කළ දින සිට දෙමසක් ඇතුලත ඇප තැබිය යුතුය. | අමාත්‍යාංශ නිලධාරීන් ඇප තැබීම සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඇප ආඥා පනතේ 612 අධිකාරිය 4 වගන්තිය ප්‍රකාරව නිලධාරීන් විසින් ඇප තැබීම සඳහා ඇප |

| | | |
|---|---|---|
| | | සුරැකුම්පත්ලබා ගැනීමට එක් එක් නිලධාරියා වෙතින් සම්පූර්ණ කරන ලද ලේඛන, රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමය වෙත 2020.09.24 දිනැතිව යොමු කර ඇති බව. |

**3.3 හානි හා පාඩු**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශ** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2009 මැයි 12 දින අනතුරට ලක්වූ අමාත්‍යාංශයේ අංක HE – 2381 දරන වාහනයේ අනතුරු සම්බන්ධයෙන් වූ රු. 251,334 ක අලාභය මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දින දක්වාම අදාල පාර්ශවයන්ගෙන් අය කර ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය. | අලාභයන් අදාල පාර්ශවයන්ගෙන් අයකර ගත යුතුය. | ලංකා විදුලිබල මණ්ඩලය නීතිපති දෙපාර්තමේන්තුව සමඟ නීතිමය ගැටළු නිරාකරණය කර ගනිමින් පවතින අතර එහි වර්තමාන තත්ත්වය ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් විමසීම් කර ඉදිරියේදී පියවර ගැනීමට නියමිත බව. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශයේ පුරප්පාඩු 25 ක් පැවති අතර ආයතනය කාර්යක්ෂමව පවත්වාගෙන යාම සඳහා අත්‍යවශ්‍ය වන අතිරේක ලේකම් (සැලසුම් හා සංවර්ධන) , අධ්‍යක්ෂ (සැලසුම්), පරිපාලන නිලධාරී ඇතුළු පුරප්පාඩු 11 ක් පිරවීමට ඉහළ කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට හෝ ඒවා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩුවී ඇති තනතුරු සඳහා කඩිනමින් නිලධාරින් අනුයුක්ත කර ගැනිම සම්බන්ධයෙන් වරින් වර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දැනුවත් කිරිමට කටයුතු කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වන විට අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව ලංකා විදුලිබල මණ්ඩලයට අනුයුක්ත සේවකයින් 27 දෙනෙකු අමාත්‍යාංශයේ සේවයට යොදවාගෙන ඇති අතර අතැම් නිලධාරීන් 2006 වර්ෂයේ සිට අමාත්‍යාංශයට අනුයුක්තව ඇති බව නිරීක්ෂණය විය. | 2003 ජූනි 02 දිනැති හා අංක PED /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රෙල්ඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඇමුණුමක් පමණක් ඉදිරිපත් කර තිබුණි. |